**හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (ව්‍යාපෘති II)- 2018**

---

හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (ව්‍යාපෘති II) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ලංකා විදුලිබල මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 දෙසැම්බර් 19 දින එළඹි අංක 3483 - එස්ආර්අයි හා 3484 - එස්ආර්අයි දරන ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ Agency Francaise de Development අතර 2018 ඔක්තෝබර් 17 දින එළඹි අංක සීඑල්කේ 1022 01 කේ දරන ණය පහසුකම් ගිවිසුමේ 3 ව්‍යවස්ථාවේ 3.4.4 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

ණය ගිවිසුම් වලට අනුව, ලංකා විදුලිබල මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ පවිත්‍ර විදුලිබල උත්පාදනය පද්ධති කාර්යක්ෂමතාවය හා විශ්වාසනීය බව වැඩිදියුණු කිරීමයි. ණය ගිවිසුමට අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 37,895 කට සමාන එජඩො මිලියන 260 ක් වන අතර, ඉන් රු. මිලියන 21,862.5 කට සමාන එ.ජ.ඩො. මිලියන 150 ක් මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණු අතර රු. මිලියන 4,372.5 කට සමාන එ.ජ.ඩො. මිලියන 30 ක් මූල්‍යායනය කිරීමට Agency Francaise de Development ආයතනය එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 11,660 ක් මූල්‍යනය කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජූලි 10 දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

### 1.3 මතය

වැඩසටහනේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී

## 2. මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/02 චක්‍රලේඛය | 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩ සටහනේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 31 දිනට හෝ ඊට පෙර විගණනය සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය වුවද, 2019 මැයි 03 දින ඉදිරිපත් කර තිබුණි. | චක්‍රලේඛ උපදෙස්වල දක්වා ඇති ප්‍රධාන අවශ්‍යතාවගෙන් බැහැරව තිබුණි. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ. | චක්‍රලේඛ උපදෙස්වලට අනුගත වීම අවශ්‍ය වේ. |
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 දරන චක්‍රලේඛයේ 09 වගන්තිය | ව්‍යාපෘති සමාලෝචන කමිටු ස්ථාපනය කර නොතිබුණි. | වැඩසටහන විසින් ක්‍රියාත්මක කරන ලද කටයුතුවල භෞතික ප්‍රගතිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායකනය විසින් නිරන්තරයෙන් සමාලෝචනය කර නොතිබුණි. | සියළුම ව්‍යාපෘති සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් මාසික ප්‍රගති සමාලෝචනය සිදු කර ඇත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුගත වීම අවශ්‍ය වේ. |
| (ඇ) | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2016 ජුනි 10 දිනැති අංක 02/2016 දරන චක්‍රලේඛය | වැඩසටහන අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට පියවර ගෙන නොතිබුණි. තවද, වැඩසටහනේ ගනුදෙනු ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට යටත් වී නොතිබුණි. | ගනුදෙනු වාර්තා කිරීම සම්බන්ධ මූල්‍ය පාලනයන් දුර්වල මට්ටමක පැවතුණි. | වැඩසටහන සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි. | වැඩසටහනේ මූල්‍ය පාලනයන් ශක්තිමත් කිරීමට වැඩසටහන සඳහා අභ්‍යන්තර විගණකවරයකු පත් කිරීම අවශ්‍ය වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 වැඩසටහනේ කටයුතුවල භෞතික ප්‍රගතිය

ණය ගිවිසුම්වලට අනුව බලශක්ති කාර්යක්ෂමතාවය සඳහා සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, මධ්‍ය - වෝල්ටීයතා ජාලයෙහි කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ ඉල්ලුම්ගත කළමනාකරණය වැඩිදියුණු කිරීම යන ප්‍රධාන සංරචක 3 ක් යටතේ වැඩසටහනේ කටයුතු ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු අතර, පැකේජ 07 ක් යටතේ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත්, එම කටයුතු සැලසුම් කළ දිනය වන 2016 ජූලි 31 දින සිට වර්ෂ 02 ඉක්මවා කාලයක ප්‍රමාදයක් සහිතව ආරම්භ කර තිබුණු අතර, ප්‍රමාදයක් ආවරණය කිරීමට පියවර ගැනීමකින් තොරව කටයුතු ක්‍රියාත්මක කර තිබුණි. එම නිසා මිල විචලතාවයන් මත කොන්ත්‍රාත්වල අමතර පිරිවැය ඇතිවීම, බැඳීම් ගාස්තු සහ වැඩසටහනේ කාලපරිච්ඡේදය දීර්ඝවීමේ අවධානම විගණනයේදී බැහැර කළ නොහැකි විය. ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ පැහැදිළි කිරීම්වලට අනුව, අමාත්‍ය මණ්ඩලයේ, මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබා ගැනීමට සහ ණය නියෝජිතායතනයෙන් අරමුදල් ලබාගැනීමට කාලය ගතවීම හේතුවෙන් වැඩ ආරම්භ කිරීමේ ප්‍රමාදයක් සිදු වී තිබුණි.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන ගැටළුව<br>-------------------- | බලපෑම<br>---------- | කළමනාකරණයේ අදහස් දැක්වීම<br>----------------------- | විගණකගේ නිර්දේශය<br>---------------- |
|---|---|---|---|---|
| (අ) | සුපිරි ජාලක සහ මැනීම් සහ ඒ සඳහා උපදේශන සේවා සැපයීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 1,617.88 කට සමාන එ.ජ.ඩො. මිලියන 11.10 කට පිරිනමන ලද කොන්ත්‍රාත් අතහැර දමා තිබුණි. පසුව එම කොන්ත්‍රාත් යටතේ වැඩ නිසි හේතුවලින් තොරව වැඩසටහනේ විෂය පථයෙන් ඉවත් කර තිබුණි. | වියපැහැදම් නොකරන ලද ශේෂය මත බැඳීම් ගාස්තු ගෙවීමට සිදු වේ. | වර්තමානයේ සුපිරි ජාලක සහ මැනීම් පද්ධතිය පිළිබඳ තාක්ෂණය පෞද්ගලික අංශය විසින් භාවිතා කරනු ලබන අතර ශ්‍රී ලංකාවේ යල්පැන ගිය තාක්ෂණයන් බවට පත්වී ඇත. එම නිසා ඒ සම්බන්ධයෙන් නියමු ව්‍යාපෘතිය අවසන් කර ඇත. | ණය ගිවිසුම්වලට එළඹීමට පෙර ව්‍යාපෘති කටයුතුවල අරමුණු පැහැදිළිව හඳුනාගත යුතුය. |
| (ආ) | කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේ සහ අදාල අරමුණ සඳහා සුදුසු ඉඩමක් අත්පත් කර ගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් මධ්‍ය වෝල්ටීයතා ජාලයෙහි කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ සංරචකය යටතේ ඇතුල් කෝට්ටේ, බෙලිගහ සහ රත්නපිටිය යන ප්‍රාථමික උපපොළවල්වල ඉදිකිරීමේ සහ | වැඩසටහනේ කටයුතු ප්‍රමාද වන අතර, ලංකා විදුලිබල මණ්ඩලයට බැඳීම් ගාස්තු ගෙවීමට සිදු වේ. | රත්නපිටිය ප්‍රාථමික උපපොළ සඳහා ඉඩමක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු 2016 දී ආරම්භ කර ඇත. කෙසේ වෙතත්, අයිතිය පිළිබඳ ගැටළු සහ 2018 දී ඉදිකිරීම් ප්‍රසම්පාදනය ආරම්භ | ප්‍රාථමික උපපොළ ඉදි කිරීම සහ වැඩිදියුණු කිරීමේ ටෙන්ඩරය නොපමාව ප්‍රදානය කිරීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව 2018 දෙසැම්බර් 31 දින වන විටත් පිරිනමා නොතිබුණි. | | කර තිබීම හේතුවෙන් 2016 දී හඳුනාගත් ඉඩම මිලදී ගැනීමට නොහැකි විය. | |
| (ඇ) | 2018 ඔක්තෝබර් 17 දින Agency Francaise de Development සමඟ යූරෝ මිලියන 30 ක ණය පහසුකම් ගිවිසුමකට එළඹ තිබුණද, මහඉලුප්පල්ලම, ඇතාගල, වයිනාබේ සහ සූරියවැව බෙදා හැරීමේ අංශවල කුළුණු ඉදි කිරීම සහ මහඉලුප්පල්ලම, ඇතාගල, වයිනාබේ සහ වෙනිවැල්ආර ප්‍රදේශවල ග්‍රෑන්ට්‍රි ඉදිකිරීම පිළිබඳ සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2018 දෙසැම්බර් 31 දින වන විට අවසන් කර නොතිබුණි. | ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාද වන අතර වියපැහැදම් නොකරන ලද ශේෂය මත බැඳීම් ගාස්තු ගෙවීමට සිදු වේ. | මිල පිළිබඳ සාකච්ඡා සඳහා දීර්ඝ ප්‍රමාදයන් සිදුවීම හේතුවෙන් 2017 දෙසැම්බර් වන විට ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කිරීමට නොහැකි විය. | කුළුණු ඉදි කිරීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කළ යුතුය. |

### 3.3 ඌන උපයෝජිත සම්පත්

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකයේ නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් මූලා ඉලක්කවලට අනුව, සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. මිලියන 13,730 කට සමාන එ.ජ.ඩො. මිලියන 94.20 ක් උපයෝජනය කිරීමට අපේක්ෂා කර තිබුණු අතර, එම ඉලක්කයෙන් 2018 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 2,327 හෝ සියයට 17 කට සමාන එ.ජ.ඩො. මිලියන 13.8 ක් පමණක් අත්කර ගෙන තිබුණි. | වියපැහැදම් නොකළ ශේෂය මත රු.මිලියන 22.81 ක බැඳීම් ගාස්තු ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවීමට සිදු වේ. | නොවැළැක්විය හැකි සිද්ධීන් හේතුවෙන් අරමුදල් උපයෝජනය බලාපොරොත්තු වූ ප්‍රමාණයට වඩා අඩු විය. | ප්‍රමාද වූ ක්‍රියාකාරකම් ලඟාකර ගත යුතුය. |

### 3.4 මතභේදයට තුඩුදෙන ගැටළු

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| වැඩසටහනේ සිවිල් කොන්ත්‍රාත් වැඩ සම්බන්ධ කොන්ත්‍රාත්කරුවන් මඟින් 2016 සිට 2018 කාලපරිච්ඡේදය තුළදී | මෝටර් වාහනවල අයිතිය එම කොන්ත්‍රාත්කරුවන් සතු | මෝටර් වාහනවල පිරිවැය මූලා ප්‍රකාශනවල කෙරීගෙන | ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය විසින් මෝටර් වාහනවල අයිතිය |

| | | | |
|---|---|---|---|
| වැඩසටහන විසින් මිලදී ගෙන තිබුණු වේ. මෝටර් වාහන 16 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙනම දක්වා නොතිබුණු බව නිරීක්ෂණය විය. | | යන වැඩ යටතේ ඇතුළත් කර ඇත. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වෙත මාරු කිරීමට පියවර ගත යුතු අතර, ඒ පිළිබඳ දත්ත සමුදාය පවත්වාගත යුතුය. තවද, වත්කම්වල විවිධ ජීවිත කාලයන් පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශනවල වාහනවල වටිනාකම වෙනම පෙන්විය යුතුය. |

## 3.5 පද්ධති හා පාලනයන්

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| -------------------- | ---------- | ----------------------- | ------------------------ |
| ප්‍රධාන සංරචක 03 යටතේ වැඩසටහනේ කටයුතු අධීක්ෂණය හා නියාමනය ලංකා විදුලිබල මණ්ඩලයේ වෙනම අංශ ප්‍රධානීන් තුන්දෙනෙකුගේ විෂය පථය යටතේ පවතී. | වැඩසටහනේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්ට එය හේතු වේ. | සියළුම සංරචක ප්‍රධාන ධාරාවන් 03 ක් යටතේ වන අතර, අංශ ප්‍රධානීන් විසින් වෙනම නියාමනය කරනු ලැබේ. | සියළුම සංරචක සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු පත් කිරීම අවශ්‍ය වේ. |